# දේශීය ජනවෙදකම
# හා ශාන්තිකර්ම

දර්ශන විශාරද (PhD) උපාධිය සඳහා FGS/04/01/08/2007/01 අංකය යටතේ කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධනය යි.

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
19 DEC 2014
UNIVERSITY OF KELANIYA

928

අධ්‍යයනාංශය - සිංහල අධ්‍යයනාංශය

නම - ඒ.එම්. තිලකදාස (BA,MA)

අධ්‍යයන වර්ෂය - 2014

# හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ලංකාව බුද්ධිමත් මිනිසුන් වාසය කළ බව ඓතිහාසික මූලාශ්‍රවලින් හෙළිවේ. ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසෙහිදී ඉන්දියාවේ ලාඩ දේශයේ සිට විජය කුමරු ලංකාවට පැමිණෙන විට යක්ෂ, දේව, නාග, මනුෂ්‍ය, යන ගෝත්‍ර හතරක මිනිසුන් මෙරට වාසය කළ බව ග්‍රන්ථාගත තොරතුරුවලින් අනාවරණය වේ. එමෙන්ම ඉහත සඳහන් චතුර්විධ මිනිස් වර්ගයා සෞඛ්‍යසම්පන්නව ජීවත් වී ඇති බවද ඓතිහාසික මූලාශ්‍ර වලින් ප්‍රකට කෙරේ. අතීත ලක්වැසියන් තමන්ට මුහුණ පෑමට සිදුවූ ලෙඩදුක්, මරණ, අකුරු ආබාධ දුරු කර ගැනීම සඳහා ඔවුනටම ආවේනික වත්පිළිවෙත් රටාවක් අනුගමනය කර ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. ඒ සඳහා අත්බෙහෙත් භාවිත කිරීමත් විවිධ කෙම්පහන් සිදු කිරීමත් යකුන්, දෙවියන්, මළගිය ඥාතීන්, ඉර හඳ, තාරකා, සහ විශාල වෘක්ෂ යන දෘශ්‍යමාන හා අදෘශ්‍යමාන වස්තූන් උදෙසා පුද පූජා පවත්වා සෙත ශාන්තිය උදාකර ගැනීමට යොමුවී ඇති බව ජනවෛද්‍යකමෙහි අන්තර්ගත වත්පිළිවෙත් විමර්ශනය කිරීමේදී මනාව අවබෝධ කරගත හැකි වේ. අතීතයේදී උක්ත වෙදකම වෙදැදුරු, යකැදුරු, කපු, පත්තිනි, නැකැත්කරු, සහ බලිඇදුරු යන මෙකී පංච පුද්ගල කොට්ඨාශය විසින් සිදුකළ අතර බුදුසමය ප්‍රචලිත වීමෙන් පසු ගමේ පන්සලේ හාමුදුරුවන්ද සහසම්බන්ධ වී ඇතිබව ගම්‍යමාන වේ. අතීත ජනසමාජයේ මිනිසුන් හට යක්ෂ, භූත, ප්‍රේත, පිසාච, ග්‍රහ, දේව, යන අමනුෂ්‍යයින්ගෙන් ඇතිවන රෝගාබාධවලදී ජනවෛද්‍යකමෙහි එක් අංගයක් වූ ශාන්තිකර්ම විධි පැවැත්වූ අතර කර්මානුරූපව ඇතිවූ රෝගාබාධයන් සඳහා බෞද්ධ වත්පිළිවෙත් උපයෝගී කොටගෙන කායික හා මානසික සුවසහනය උදාකරගෙන ඇති බව විද්‍යමාන වේ. උක්ත වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව අපගේ පර්යේෂණ කටයුතු සිදුකළ අතර එමගින් තත් වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රාමාණික අවබෝධයක් ලබාගත හැකි විය. මෙකී පර්යේෂණ කටයුතු සිදු කිරීමේදී ලිඛිත හා අලිඛිත මූලාශ්‍රය, ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රත්‍යයික අධ්‍යයනය යන පර්යේෂණ ක්‍රමවේදයන්ට අනුව කරුණු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙළෙමි.